# මහවැලි තැන්නේ ඉපැරණි වාරි විස්කම්

සමනොළ ගිර සිරිපා සිඹ දුර ගමන් අරඹන ලස්සන මහවැලි ලාලනිය, පියමං කරන මහ විස්කම් වැඩ අපේ මුතුන් මිත්තන්ගේ ප්‍රෞඪ අතීතය යළි සිහිගන්වයි. හෝටන් තැන්නෙන් ගමන් අරඹා හැටන් සානුව දිගේ කඳු ගැට සිසාරා මහවැලිය ගලා යද්දී, ඇයට එක් වන අතු ගංගා ඇගේ දිග ගමනට රුකුල් දෙයි. ගමනේ මුල් හරියේ නාවලපිටිය අසලදී කොත්මලේ ඔය මහවැලියට එක් වේ.

ගම්පොළ පසුකොට පේරාදෙණියට වීත්, පියකරු මල්වත්ත පැදකුණු කොට ගලා යන මහවැලිය, මහනුවර, කටුගස්තොට සහ පොල්ගොල්ල ඔස්සේ විත්, අසිරිමත් වික්ටෝරියා දිය ඇල්ල නිර්මාණය කරමින් රන්ටැඹේ පෙදෙස සරු සාර කර මහගල් පවුරු අතරින් වැටුන දුර්ග මාර්ගයක් ඔස්සේ ඉදිරියට ඇදෙයි. මෙතැනින් මීණිපේ තෙක් දිවෙන මහවැලිය, අතීතයේදී කෙත්වත් සරු කිරීම සඳහා සිය ජල කඳ හැර වූ මිනිපේ පෙදෙසින් මහවැලි තැන්නට ඇතුළු වන්නිය.

මිනිපෙන් ඔබ්බේ මහියංගන චෛත්‍යය ද නමදිමින් ගලා යන මහවැලි ලාලනිය දැන් සිය ගමන ඉක්මන් කරමින් වේගයෙන් ඉදිරියට ඇදී යන්නීය. වම් ඉවුරෙහි ලස්සන වස්ගමුව අභය භූමිය පෙනේ. මිනිපේ සිට කෙලින්ම පෙරට ආ ඇය දැන් මඳක් දකුණට හැරී කාලිංග දූපත වට කරන්නී ය. වම් හා දකුණු නිම්නයන්හි ඉදි කෙරුණ ඇල මාර්ග දෙකක් මගින් මහවැලි ගමන් මග දෙආකාරයකට වෙනස් කරන ලද්දේ මෙහිදී ය. මේ විශිෂ්ඨ වාරිමාර්ග විස්කමෙහි උපත කාලයේ වලා පටලයෙන් වැසී පවතී. පැරණි කියමන්වලට අනුව ත්‍රිකුණාමලයේ සිට කාලිංග තෙක් නැව් ගමනා ගමනයක්ද පැවතිණි.

මහවැලියේ ලොකුම සහකාරිය වන අඹන් ගඟ කාලිංග දිවයිනට මඳක් ඔබ්බෙහි දී මහා ගංගාවට එක් වේ. මනම්පිටිය පාලමට සැතපුම් තුනක් පමණ ඈතින් ඇය අතීතයේ ගමන් ගත් පැරණි මග දැන් සිඳී වියලී ගොස් ඇති අයුරු දිස් වේ. සෝමාවතිය, කොම්බනච්චි සහ සේරුවාවිල වැනි විහාර මෙම පැරණි මග දිගේ පිහිටා තිබේ. අතීත භේදවාචකයක් නිසාවෙන් මහවැලියේ මුල් ගමන් මග වෙනස්ව අප දකින නව මහට පිවිස ඇත. මෙතැන් සිට ඇති නව මහ ඉතිහාසය වසර දෙදහකට අඩු තරම්ය.

නව මහෙහි සැතපුම් දෙකක් පමණ දුර ගිය තැන මහ කළු ගලින් නිමැවුණ විසල් ඇත් රුවක් දක්නට ලැබේ. කලින් උස් බිමක් තිබූ මෙම 'ගල් අලියා' දැන් ජලයෙන් යටවී ඇත. මෙය මුතුගල ආරාම (ක්‍රි. පූ. 200 - ක්‍රි. ව. 700) මූර්ති නිර්මාණයන්ට අයත් ය.


ටික දුරක් ගොස් කන්දෙකඩුව අමුණ පසු කරන මහවැලිය දැන් වියලී ඇති ඇගේ පැරණි මඟ හරහා සෘජු කෝණිව ගලා බසී. ඊටත් මඳක් ඈතින් මහවැලිය සිය අවසන් ගමනට සැරසෙන්නේ අතු ගංගා දෙකක් ලෙස වෙන් වීමෙනි. ප්‍රධාන අතු ගංගාව, උතුර බලා යමින් ත්‍රිකුණාමලයේ කොඩියාර් බොක්ක හරහා සයුරට වදී. වෙරුගල් ආරු නම් කුඩා අතු ගඟ නැගෙනහිරින් මුහුදට වැටේ. අතීතයේ කුඩා පටු ඇල මඟක් වූ වෙරුගල් ආරු හා ප්‍රධාන මහ වැලිය අතර සරු කෙත් බිම් වූ බව හෙළි වේ.

### මහවැලියේ පැරණි වාරිමාර්ග ක්‍රම

ක්‍රි. ව. 459 දී පමණ ධාතුසේන රජතුමා මිනිපේ දී මහවැලි ගඟ හැර වූ බවට ඉතිහාසය දෙස් දෙයි. මහවැලි වම් ඉවුරේ ඔහු ඉදි කළ පැරණි ඇල මගින් මිනිපේ විශාල කුඹුරු යායකට ජලය සපයා ඇත. චූලවංශය මිනිපේ අමුණ පළවන අග්‍රබෝධි රජුගේ නිර්මාණයක් යැයි සඳහන් කරයි. මේ ඇල මඟ වස්ගමුව වන රක්ෂිත පෙදෙස් හරහා අංගමැඩිල්ලේ දී අඹන් ගඟට වැටේ. ක්‍රි: ව: 368 දී පමණ උපතිස්ස රජු තම තෝපාවැවට ජලය ගැනීම සඳහා මෙහි ඇල මඟක් කැපී ය. මහා පරාක්‍රමබාහු රජතුමා සිය විශිෂ්ඨ නිර්මාණය වූ පරාක්‍රම සමුද්‍රය ඉදි කර වද්දී මේ ඇල මඟ ද තෝපා වැව ද එයට එක් කළේ ය.

තමා ඉදි කල කුඩා මින්නේරි වැවට ජලය ගෙන යෑමට වසභ රජතුමා ක්‍රි. ව. 100 අඹන් ගඟ හරහා ඇලහැර සිට මින්නේරිය තෙක් ඇලක් කපන ලදී. නැවත ක්‍රි: ව: 275 දී පමණ මහසෙන් රජතුමා මේ ඇල මඟ විශාල කර දිවයිනෙහි විශිෂ්ඨතම වාරි නිර්මාණයක් වන

## මහවැලි තැන්තලාවේ පැවති පැරණි වාරිමාර්ග ක්‍රම



මින්නේරිය වැව ඉදි කළේය. මෙම ඇල මග තම කවුඩුල්ල වැව දක්වා මහසෙන් රජ විසින් දිග් කරවන ලදී. ඉන් අනතුරුව දෙවැනි අග්‍ර බෝධි රජතුමා ක්‍රි. ව. 610 දී ගිරිතලේ වැව නිම කර ඇලහැර ඇල ද ඊට යාකර කවුඩුල්ලේ සිට කන්තලේ තෙක් ඇලහැර ඇල මාර්ගය දීර්ඝ කළේ ය.

මිනිපෙන් ඔබ්බෙ මහවැලි ලාලනිය මයියන්ගනයට ආචාර කරන්නීය. මයියන්ගනයට උතුරින් දක්නට ලැබෙන සොරබොර වැව දුටුගැමුණු රජු කල (ක්‍රි. පූ. 150) බුලතා නම් වැදි නායකයකු විසින් ඉදි කර ඇති මහා විස්කමකි. මහවැලියේ කුඩා අතු ගංගාවක් හරහා වේල්ලක් බැඳීමෙන් සොරබොර වැව ඉදි කොට ඇත.

කාලිංග පුරාණයේ දී මහවැලිය දෙමහකට යොමු කළ අයුරු කලින් සඳහන් කෙරුණේය. සම්ප්‍රදයට අනුව දකුණු ඉවුරේ ගෝමතී ඇල සැතපුම් 50 ක් පමණ මග ගෙවූ අතර, මෙම ඇල දිගේ මහා ජල කඳක් වෙරුගල් ආරු වෙත ගලා ගියේ ය. මෙය මහසෙන් රජු විසින් ඉදි කරන ලදී. කාලිංග ඇල නමින් ද හැඳින්වූ වම් ඉවුරේ අචිරවතී ඇල ත්‍රිකුණාමලයේ ඉමට ආසන්න පෙදෙසක් තෙක් ජල කඳ ගෙන ගියේ ය. කාලිංග ඇල වැඩවලින් කොටසක් ධාතුසේන රජු විසින් කරවන ලදැයි ඉතිහාසඥයෝ විශ්වාස කරති. වම් ඉවුර ඇල ඔහුගේ නිර්මාණයක් ලෙස සැලකේ.

අවාසනාවකට මෙන් පසු කලක මෙම ඇල මාර්ග දෙකම අචහිරවී මුළු වාරිමාර්ග රටාවටම බාධා පැමිණ මහවැලි නිම්නයේ විශාල ජනකායකට මහත් සාගතයකට මුහුණ දීමට සිදු වූ බව පෙනී යයි. ඇතැම් විට මහ පොළොව කම්පාවීමක් හේතුකොට ගෙන සම්පූර්ණ කාලිංග ඇල මාර්ග ක්‍රමය විනාශ වන්නට ඇතැයි අනුමාන කෙරේ.

මේ මහ විනාශය සිදු වූයේ කවරද ද යන්න වැදගත් ප්‍රශ්නයක් ව ඇත. ඉතිහාසයේ පිටු පෙරළා බලමු. සෝමාවතී චෛත්‍යය අසල අවුරුදු 2,000 ක් පමණ පැරණි ශිලා ලිපියක පැරණි ගංගාවෙහි වූ තොටුපලක් ගැන සඳහන් වේ. එහෙයින් මහවැලි ගංගා මහ වෙනස්වූයේ පසුගිය වසර දෙදහස තුළ බව අපට පැවසිය හැක. කලින් මෙම ලිපියේ සඳහන් මුතුගල ආරාමයට අයත් ගල්ඇතා ද මේ භූමි කම්පාව සිදු වූ කාලය නිගමනය කිරීමට උපකාරී වේ. මෙම ප්‍රදේශයේ සිදුවූ මහ පොලව කම්පාවීමකින් ගඟෙහි මහ වෙනස් වූවා පමණක් නොව ආරාමයද අඩි හයක් පමණ යටට කිඳා බැස ඇත. ගොඩ බිම ඉදි කළ ගල්ඇතා ද දූන් ජලයෙහි ගිලී ඇත්තේ ඒ නිසා වන්නට පිළිවනි, ක්‍රි: ව: 700 පමණ වන තෙක් මෙම ආරාමය දියුණු තත්වයක පැවති බව ලෙන් ලිපි වලින් හෙළි වෙයි. එහෙයින් මෙම මහා විනාශය සිදු වූයේ ක්‍රි.ව. 700ට පසුව හෝ අවුරුදු 1,300 කට අඩු කාලයක් තුළ යයි සැලකිය හැක. මේ සඳහා ඇති දෙවැනි සාධකය කාලිංග වාරිමාර්ග පද්ධතිය යි. මෙය ඉදි කරන ලද්දේ ධාතුසේන රජතුමා (ක්‍රි. ව. 459) විසිනි. එහෙයින් කාලිංග වාරි පද්ධතිය වැනසූ, මුතුගල මූර්ති කිඳාබැස්වූ මහවැලි ගමන් මඟ වෙනස් කොට ජනතාව කම්පනයට පත් කළ මෙම භූමි කම්පාව මෙම කාලයෙන් පසුව සිදුව ඇති බැව් සැලකිය හැක.

මහවැලි පැරණි මඟෙහි සුපතල වාරි විස්කම් දෙකක් දකින්නට ලැබේ. සෝමාවතිය අසලින් වැටුණු ඇලක් දිගේ ක්‍රි. පූ. 1 වැනි ශත වර්ෂයට පෙර මහ ජල කඳක් දූන් මින්විල වශයෙන් හැඳින්වෙන පෙදෙසට ගෙන ගිය බවට සාක්ෂි ඇත. එවකට මෙම පෙදෙස සරු කෙත් යායකින් සැරසී තිබුණත් අද එය මහ මඩ වගුරකි.

බුදු හිමියන් සහ රහත් හිමිවරුන් 500 ක් වැඩ වදරා පූජනීයත්වයට පත් සේරුවාවිල අසල පැරණි මහ වැවකි. අල්ලායි නම් මෙම වැවට වතුර ලැබුනේ ද මහවැලියෙනි. ක්‍රි. පූ. 175 දී පමණ කාවන්තිස්ස රජතුමා සේරුවිල පෙදෙසේ දගැබක් ඉදිකොට එහි බුදුන්වහන්සේගේ ලලාට ධාතුව නිදන් කරන ලදී.

ආදියේ මහියන්ගනයේ සිට සයුරු තෙර දක්වා වූ මුළු මහවැලි තැන්නම පෝෂිත වූවෙ මහවැලි වතුරෙනි. විජය මෙරටට පැමිණෙන්නට පෙරත් මෙම පෙදෙස ඇසුරින් ශිෂ්ඨාචාරයක් බිහිවී තිබුණි. නව මහවැලි වාරි වැඩ නිසා දූන් මෙම පෙදෙස් ගවේෂණයට ලක් වෙන හෙයින් විශේෂයෙන්ම, විජයට පෙර කාලය පිළිබඳ අප ඉතිහාසය නැවත ලිවීමට අපට සිදු වනු නිසැකය.